# අභිලාශය ප්‍රකාශ කිරීම (EOI)

## ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්

## බදුකරු ගිවිසුම සහ ප්‍රතිපත්ති ලේඛන සඳහා නීති උපදේශන සමාගමක් ප්‍රසම්පාදනය කිරීම

**කොන්ත්‍රාත් අංකය : SLIBTEC/PROC/314/CQS/Consultancy / Procurement of Legal Consultancy Firm for Tenant Agreement and Policy Documents.**

01. හෝමාගම, පිටිපන, තලගල පාරේ, මාහේනවත්ත පිහිටි ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) විසින් ශ්‍රී ලංකාවේ පළමු ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානයේ සංවර්ධන කටයුතු සිදු කරමින් සිටින අතර, එමගින් රට කලාපීය ජෛව තාක්ෂණ මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම අරමුණු කර ගෙන ඇත. SLIBTEC ආයතනය 2020 ඔක්තෝබර් මාසයේදී රජයට අයත් ආයතනයක් ලෙස සංස්ථාගත කරන ලද අතර, භාණ්ඩාගාර ලේකම්වරයා එහි එකම කොටස් හිමියා වේ .

02. ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ, සංවර්ධන සහ වාණිජකරණයේ නියැළී සිටින රජය සතු ආයතනයක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC), වසර දෙකක (02) කාලයක් සඳහා බදුකරුවන් සඳහා අදාළ වන ලේඛන කෙටුම්පත් කිරීම සහ ප්‍රතිපත්ති ලේඛන සමාලෝචනය කිරීමේ නීති උපදේශන සේවා සැපයීම සඳහා යෝග්‍ය සුදුසුකම් ලත් සහ පළපුරුදු උපදේශක සමාගම්වලින් අභිලාශය ප්‍රකාශ කිරීම සඳහා (EOI) ආරාධනා කරනු ලැබේ.

03. මෙම අභිලාශය ප්‍රකාශ කිරීමේ (EOI) අරමුණ වන්නේ SLIBTEC නවෝත්පාදන උද්‍යානයේ සංවර්ධනය හා මෙහෙයුම් සම්බන්ධයෙන් පුළුල් නීති උපදේශන සහ කෙටුම්පත් සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් නීති උපදේශන සේවා සපයන්නෙකු හඳුනාගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමයි. තෝරාගත් උපදේශක සමාගම ශක්තිමත් සහ අනුකූල සම්මත කල්බදු ව්‍යුහයක් සකස් කිරීම මෙන්ම සම්බන්ධ වන සියලුම පාර්ශ්වයන්ගේ අදාළ නියමයන්, කොන්දේසි, මාර්ගෝපදේශ, අයිතිවාසිකම් සහ බැඳීම් පැහැදිලිව නිර්වචනය කරන ඒ ඒ බදුකරු සඳහා විශේෂිත කල්බදු ලියකියවිලි සකස් කිරීම, නීතිමය නිරවද්‍යතාවය, අවදානම් අවම කිරීම සහ අදාළ නීති සහ නියාමන අවශ්‍යතා සමග පෙළගැස්වීම සහතික කිරීම සඳහා බැඳී සිටී..

04. යොමු නියමයන් (TOR) හි සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු, සුදුසුකම්ලත් සහ පළපුරුදු උපදේශන සමාගමක විෂය පථය අවශ්‍ය වනු ඇත (සියලුම ක්‍රියා පටිපාටි අදාළ රජයේ/පළාත් පාලන නීති සහ රෙගුලාසි වලට අනුකූල විය යුතුය)

05. උනන්දුවක් දක්වන උපදේශන සමාගම TOR හි සඳහන් අවම අවශ්‍යතා සපුරාලිය යුතුය.

06. උපදේශන සමාගම විසින් www.slibtec.gov.lk/procurement වෙබ් අඩවියේ දක්වා ඇති ආකෘතියට අනුව උපදේශන සේවාව ඉටු කිරීම සඳහා යොදගන්න අයවලුන් සුදුසුකම්ලත් පුද්ගලයින් බව තහවුරු කෙරෙන ප්‍රමාණවත් ලියකියවිලි සමග පහත තොරතුරු සැපයිය යුතුය. උපදේශන සමාගම සඳහා අදාළ වන යොමු නියමයන් (TOR) සහ අනෙකුත් තොරතුරු පරිශීලනය කිරීම සඳහා වෙබ් අඩවියට උඩුගත කර ඇත.

    අ) **සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අත්සන් කරන ලද අභිලාශය ප්‍රකාශ කිරීමේ ලිපියක්**

    ආ) ආයතනයේ පැතිකඩ **(Profile of the firm)**

    ඇ) **පසුගිය වසර 10 තුළ සම්පූර්ණ කරන ලද සමාන පැවරුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාක්ෂි.**

    ඈ) ව්‍යාපාර ලියාපදිංචිය

**උපදේශන සමාගම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශනවල අනුව සඳහන් ළබැඳියාවන් අතර ගැටුම් සඳහා අදාළ වන විධිවිධානවලට අනුකූල විය යුතුය.**

07. ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය විසින් ප්‍රකාශයට පත් කරන ලද උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම යන මාර්ගෝපදේශවල දක්වා ඇති ක්‍රියා පටිපාටිවලට අනුකූලව හා උපදේශකයින්ගේ සුදුසුකම් (CQS) - Firm (2027 අගෝස්තු) මත පදනම්ව උපදේශන සමාගම තෝරා ගනු ලැබේ. අභිලාශය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය මගින් තෝරාගනු ලබන කෙටි ලයිස්තුගත උපදේශකයින් හට පමණක් විස්තරාත්මක යොමු නියමයන් (TOR) නිකුත් කොට තාක්ෂණික හා මූල්‍ය යෝජනා ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබේ. උපදේශන සමාගමේ අවසාන ලෙස තෝරාගැනීම් යොමු නියමයන් (TOR) සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ඇගයීම් නිර්ණායක හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව සිදු කරනු ලැබේ.

08. උනන්දුවක් දක්වන උපදේශන සමාගම් හට වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ලබා ගත හැකිය. ලිපිනය : අදියර I ගොඩනැගිල්ල, මාහේනවත්ත, තලගල පාර, පිටිපන, හෝමාගම, තරිඳු මධුශංඛ මහතා (ප්‍රසම්පාදන කළමනාකරු) දුරකථන අංකය: +94 11 3431844 සඳුදා සිට සිකුරාද දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 4.30 දක්වා. වැඩි විස්තර සඳහා කරුණාකර www.slibtec.gov.lk වෙත පිවිසෙන්න.

09. ඉල්ලා සිටින සියලුම තොරතුරු ඇතුළු අභිලාශය ප්‍රකාශ කිරීම 2026 ජූලි 24 වන දින පස්වරු 2.30 ට පසුව පහත දක්වා ඇති ලිපිනයට අනුපිටපතක් සමග භාර දිය යුතුය. අභිලාශය ප්‍රකාශ කිරීම අඩංගු ලියුම් කවරයේ "බදුකරු ගිවිසුම සහ ප්‍රතිපත්ති ලේඛන සඳහා නීති උපදේශකයින් " ලෙස සලකුණු කළ යුතුය.

**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී**
**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්,**
**SLIBTEC අදියර 1 ගොඩනැගිල්ල,**
**මාහේනවත්ත, තලගල පාර,**
**පිටිපන, හෝමාගම.**
**දුරකථන : +94 113431844**
**විද්‍යුත් තැපෑල : slibtec@gmail.com**
**වෙබ් අඩවිය : www.slibtec.gov.lk**

**2026 ජූලි 10**